# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2010

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන වල තොග වටිනාකම ලෙස භෞතිකව සත්‍යාපනය කල තොග වටිනාකම දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.488,395 ක් වූ ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය ඉතිරි තොග වටිනාකම ලෙස දක්වා තිබුණි.

#### 1.2.2 ගණකාධිකරණ අඩුපාඩු

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

අ. විගණන නියැදි පරීක්ෂාවේදි අනාවරණය වූ එකතුව රු. 1,040,248 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2011 මාර්තු 23 දිනැති කෙටුම්පත් වාර්තාවෙන් යොමුකරන ලදි. එයින් රු. 830,432 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කෙරිණි. නිවැරදි නොකල රු. 209,816 ක ගණකාධිකරණ අඩුපාඩු පැවති අතර තවදුරටත් එවැනි අඩුපාඩු තිබීමේ ඉඩකඩ විගණනයේදි බැහැර කල නොහැක.

ආ. සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ප්‍රකාශන තොග ශේෂයට වඩා ප්‍රකාශන 11ක පොත් 479 ක් වැඩියෙන්ද , එක් ප්‍රකාශනයක පොත් 162 ක් අඩුවෙන්ද ,ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි ප්‍රකාශන තොගයේ වටිනාකම ගණනය කර තිබූ බැවින් ප්‍රකාශන තොගයේ වටිනාකම රු.114,101 කින් වැඩියෙන් දැක්වුණි.

1.2.3 **<u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ආපදා ණය සහ වාහන ණය ගිණුම් ශේෂයන් හා උපලේඛන අතර පිළිවෙලින් රු.8,586 හා රු.846 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.2.4 **<u>ලැබිය යුතු ගිණුම්</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ. එකතුව රු.61,743 ක්වූ ණය අත්තිකාරම් ශේෂ 05 ක් දීර්ඝ කාලයක සිට නිරවුල් වී නොතිබුණි.

ආ. රු.17,540ක ණයගැති ශේෂයක් වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන ගොස් තිබුණි.

1.2.5 **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>**

පහත සඳහන් නීති ,රීති ,යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම.</u>** |
|---|---|
| (අ.) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මු .රෙ.757 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වත්කම් සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| ii. මු .රෙ. 1645 | ආයතනය සතු වාහන දෙකට අදාලව ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| iii. මු .රෙ .1646 | ආයතනය සතු වාහන දෙකට අදාල මාසික සාරාංශ නියමිත ආකෘතියෙන් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ). | උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXVII පරිච්ඡේදයේ 9.1 වගන්තිය | පරීක්ෂා කරන ලද නියදිය තුල කි.මී.2182 ක් වූ ගමන් අවස්ථා 25 ක් සඳහා වාහනය පාවිච්චි කල නිලධාරියා කෙටි අත්සන් තබා සහතික කර නොතිබුණි. |
| (ඇ). | අංක 09 හා 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදය | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර පුස්තකාල පොත් හා සඟරා, කාර්යාල උපකරණ සහ පවිත්‍රතා හා ආරක්ෂක සේවා වෙනුවෙන් රු.688,685 ක වියදම් දරා තිබුණි. |
| (ඈ). | 1978 දෙසැම්බර් 19 දින හා අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු. 4,607,448 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි . |

1.2.6 **<u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u>**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජුනි 14 දිනැති හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීනතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.36,960ක් ගෙවා තිබුණි.

2 **<u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>**

2.1 **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.4,758,051 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,718,878 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.7,900,000ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගත් පසු එම ඌනතාවය රු.3,141,949 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 6,000,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 718,878 ක් දක්වා අඩු වී තිබුණි.

## 2.2 **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

### 2.2.1 **<u>කාර්ය සාධනය</u>**

**අධ්‍යයන කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

අ. සමස්ථයක් ලෙස පසුගිය වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය ලියාපදිංචියේ වැඩිවීමක් දක්නට තිබුණද බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි ඉංග්‍රීසි පාඨමාලාවට ශිෂ්‍ය ලියාපදංචිය 23% කින් අඩුවී තිබුණි.

ආ. ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයට වඩා 45% කින් අඩුවී තිබුණි.

ඇ. සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාඨමාලා වල විභාග ප්‍රතිඵල මේ දක්වා නිකුත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වී තිබුණි.

### 2.2.2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය ආරම්භයේ සිට මේ දක්වා වර්ෂ 35 ක කාලයක් කුලියට ගත් ගොඩනැගිලි වල පවත්වා තිබූ අතර ඒ සඳහා ගොඩනැගිලි කුලිය දළ වශයෙන් රු.මි.4.5 ක් වැයකර තිබුණි. මේ වනවිට කොළඹින් බැහැර පිහිටි ගොඩනැගිල්ලක් වෙනුවෙන් වාර්ෂිකව රු.මි.4.5 ක් ගෙවනු ලබන අතර ආයතනය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකරවා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

### 2.2.3. **<u>අරමුදල් ඌන උපයෝජනය</u>**

විදේශ ශිෂ්‍යත්ව දීමනා සහ පර්යේෂණ දීමනා ලෙස පරිත්‍යාග වශයෙන් දීර්ඝ කාලයකට පෙර ලැබී බැංකු ගතකර තිබූ සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශේෂය පිළිවෙලින් රු. 658,629 ක් හා රු. 107,235 ක් අදාල කාර්ය සඳහා යොදා ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට ගෙනයමින් තිබුණි.

2.2.4 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගබඩා පාලනය

(ආ) වාහන උපයෝජනය

(ඇ) ස්ථාවර වත්කම්

(ඉ) ප්‍රකාශන තොග